## 15. ආහාර ප්‍රත්‍යයේ ත්‍රිරාශිය

ආහාර ප්‍රත්‍යය රූපාහාර ප්‍රත්‍යය, නාමාහාර ප්‍රත්‍යය යි දෙවැදෑරුම් වේ. ස්පර්ශ චේතනා විඥාන යන නාම ධර්මයෝ තිදෙන නාමාහාර ප්‍රත්‍ය ය.

කබලිංකාරාහාරය යි කියන ලද භෝජනාදියෙහි ඇත්තා වූ ඕජා රූපය රූපාහාර ප්‍රත්‍ය ය.

ආහාර සමුට්ඨානික රූප රූපාහාර ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, චිත්තජ රූප ය, ප්‍රතිසන්ධි කර්මජ රූප ය, බාහිර රූප ය, ඍතුජ රූප ය, අසංඥසත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු රූපාහාර ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

තවත් ක්‍රමයකින් මෙසේ ය. ආධ්‍යාත්මික චතුසමුට්ඨානික ඕජා රූපයය, බාහිර සන්තානයෙහි බාද්‍ය භෝජ්‍යාදියෙහි ඇති ඍතුජ ඕජා රූපය ය යන මොවුහු රූපාහාර ප්‍රත්‍ය ධර්මයෝ ය.

ඒක කලාපගත වූ ද හා නානා කලාපගත වූ ද ප්‍රත්‍ය ධර්මය වන ඕජා රූපයෙන් අන්‍ය වූ ආධ්‍යාත්මික චතුසමුට්ඨානික රූප සමූහය රූපාහාර ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, බාහිර රූපය ය යන මොවුහු රූපාහාර ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීකයෝ ය.

---

**ආහාරපච්චයො** - සකසකපච්චයුප්පන්නෙ - ස්වකීය ස්වකීය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්, ආහරති (භුසො හරති) - මනාව ගෙනයයි, ඉති - එබැවින්, ආහාරො - ආහාර නම් වේ. හේතු ආරම්මණ ආදී ප්‍රත්‍යයෝ ද තමාට අදළ වන්නා වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් ගෙනයත්. එසේ වුවද අධ්‍යාත්මික සන්තානයෙහි (ස්කන්ධ සන්තතියෙහි) අතිශයෙන් උපකාරක වීම නිසා කබලිංකාර ආහාරය ආදී ආහාර සතර සඳහා "ආහාර" යැයි පැවසීම පිළිබඳ අභිධර්මාර්ථ භාෂා ටීකාවේ (සමුච්චය කාණ්ඩයේ) දක්වන ලදී. " ආහරති - මනාව ගෙන යයි" යන තැන 'ගෙන යයි' යනු ප්‍රත්‍යයෝත්පන්න ධර්ම සමූහය දීර්ඝ කාලයක් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා උපකාරක වන්නා වූ උපස්ථම්භක ශක්තිය යි. මෙම ආහාර ප්‍රත්‍යය නිවෙස් ශක්තිමත් කිරීම සඳහා ඇති රුකුල් කණුවකට උපමා කොට ඇත.

විස්තර කරන්නෙමි - "මෙම ආහාර ප්‍රත්‍යය ධර්මයන්හි උපස්ථම්භක ශක්තිය පමණක් ඇත. ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් පහළ කරවීම සඳහා ජනක ශක්තියක් නැත" යැයි වැරදි අදහසක් ඇත. සත්‍ය වශයෙන් ම මෙහි ජනක ශක්තිය ද ඇත. ජනක ශක්තියෙන් උපදවන විට (සෙසු ප්‍රත්‍යයන් මෙන් හුදු උත්පාද ශක්ති මාත්‍රයක් පමණක් නොව) අඛණ්ඩව පවත්වා ගැනීම ට ද උපකාර කරනා බැවින් "උපස්ථම්භක" යැයි කීහ. විස්තර කරන්නෙමි - ආහාර ගත් විට ඒ ආහාරය හේතුවෙන් ආහාරජ රූපයන් ඉපදීම පමණක් නොව, සකල ශරීරයෙහි ම ඇත්තා වූ කර්මජ, චිත්තජ, ඍතුජ රූපයන් ද ශක්තිමත් ලෙස පවතියි. ඒ ආකාරයේ ශක්තිමත් බවක් ඇති බැවින් එම කර්මජාදී රූපයෝ ද නොනැවතී දිගට ම පවතිත්.

නාම ආහාරයෝ ද තමා හා සමඟ සහජාත ධර්මයන් උපදවත්. සමුච්චය කාණ්ඩයේදී දක්වූ ආකාරයට නාම ධර්මයන් අඛණ්ඩව පවත්වා ගැනීමට ද උපස්ථම්භක වේ.

මූලටීකා - ජනයමානොපි හි ආහාරො අවිච්ඡෙදවසෙන උපත්ථම්භයමානොයෙව ජනෙතීති උපත්ථම්භනභාවො ආහාරභාවො.

**ප්‍රත්‍යය - ප්‍රත්‍යයෝත්පන්න** - "ඔජාසඞ්ඛාතො ආහාරො ආහාරසමුට්ඨානරූපං අජ්ඣොහරණකාලෙ ඨානප්පත්තොව සමුට්ඨාපෙති" යැයි දක්වූ ආකාරයට ආහාරයේ ඇති ඕජාව රූපාහාර ප්‍රත්‍යය වේ. ආහාර සමුට්ඨානික රූපයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙත්.

**තවත් ක්‍රමයකින්** - ප්‍රථම ක්‍රමයේ දී බහිද්ධ ආහාරය ජනක ශක්තියෙන් උපකාරක වන ආකාරය අපේක්ෂා කරමින් ස්වරූපාර්ථ දක්වන ලදී. එය කුසල ත්‍රිකයේ පටිච්ච වාරය හා සම වේ. එසේ නමුත් ආධ්‍යාත්මික ආහාරයෝ ජනක සහ උපස්ථම්භක යන ශක්ති දෙකෙන් ම උපකාරක වීම ද, බහිද්ධ ආහාරය උපස්ථම්භක ශක්තියෙන් උපකාරක වීම ද දක්වෙන ස්වරූපාර්ථ මෙහි ඇතුළත්ව නොමැත. විස්තර කරන්නෙමි - ශරීරයේ කර්මජ, චිත්තජ, ඍතුජ, ආහාර වශයෙන් රූප සන්තති සතරකි. ඒ සන්තතීන්හි ඇතුළත් වන ඕජාව (ඍතුජ මෙන්) ආහාර සමුට්ඨාන රූප කලාපයන් පහළ කරවමින් සෙසු රූප කලාපයන්ට උපස්ථම්භක වේ. බහිද්ධ ඕජාව විසින් ද ශරීරයේ ආහාර රූප ද උපදවනු ලැබේ. තමා විසින් උපදවන ආහාරජ රූපයන් හැර සෙසු ඕජාවන් විසින් උපදවන ආහාරජ රූපයන්ට ද උපස්ථම්භනය වේ. සෙසු ත්‍රිජ රූපයන්ට උපස්ථම්භනය පමණක් සිදු කරයි. පළමු ක්‍රමයේදී අජ්ඣත්ත ඕජාව

විසින් සහ අජ්ඣත්තබහිද්ධ ඕජා විසින් උපකාරක වීම යන ක්‍රම දෙක ඇතුළත් නො වේ. එබැවින් මෙම දෙවන නය ක්‍රමය දක්වීය. (අජ්ඣත්තික ඕජාව විසින් ආහාර සමුට්ඨාන රූප කලාප උපදවන බව විශුද්ධිමාර්ග මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි කාණ්ඩයේ දක්වේ.)

පට්ඨාන අටුවාව - චතුසන්තතිසමුට්ඨානො කබළීකාරාහාරො කිඤ්චාපි ඉමස්ස කායස්සාති අවිසෙසතො වුත්තො, විසෙසතො පනායමෙත්ථ ආහාරසමුට්ඨානරූපස්ස ජනකො චෙව අනුපාලකො ච හුත්වා ආහාරපච්චයෙන පච්චයො හොති, සෙසසන්තතිසමුට්ඨානස්ස අනුපාලකොව හුත්වා ආහාරපච්චයෙන පච්චයො හොතීති එවමෙත්ථ පච්චයුප්පන්නතොපි විඤ්ඤාතබ්බො විනිච්ඡයොති. - පච්චයනිද්දෙස

**ප්‍රත්‍යය -** ආධ්‍යාත්මික සන්තානයෙහි ඇති චතුසමුට්ඨානික ඕජාව යනු ශරීරයේ කර්ම, චිත්ත, ඍතු ආහාර යන හේතු සතර නිසා ඇති වන වෙන් වෙන් ව උපදින්නා වූ කර්ම සමුට්ඨාන, චිත්ත සමුට්ඨාන, ඍතු සමුට්ඨාන, ආහාර සමුට්ඨාන රූප කලාප සන්තතියෙහි ඇතුළත් වූ ඕජාව යි. බැහැර ඇති භෝජනාදිය ඍතුජ රූපයෝ ය. ඒ ඍතුජ රූපයන්හි ඇතුලත් වන ඕජාව 'බාහිර සන්තානයෙහි ඛාද්‍ය භෝජ්‍යාදියෙහි ඇති ඍතුජ ඕජා රූපය' යැයි කියනු ලැබේ.

**ප්‍රත්‍යයෝත්පන්න -** "ඒක කලාපගත වූ ද නානා කලාපගත වූ ද ප්‍රත්‍යය ධර්මය වන ඕජා රූපයෙන් අන්‍ය වූ ආධ්‍යාත්මික චතුසමුට්ඨානික රූප" යන තැන චක්ෂු දශකයේ ඇති ඕජාව ප්‍රත්‍යය ධර්මය වන විට එය ප්‍රත්‍යයෝත්පන්නයන්හි ඇතුළත් නොවේ. එයින් අන්‍ය වූ ඒක කලාපගත වූ (එම රූප කලාපය තුළ ඇති) රූප නවය සහ නානා කලාපගත වූ (වෙනත් රූප කලාපයන් තුළ ඇති) කර්මජ, චිත්තජ, ඍතුජ, ආහාරජ රූපයෝ (ශරීරයේ ඇති සියලු ම රූපයෝ) ප්‍රත්‍යයෝත්පන්න වෙති.

(උපාදින්න ත්‍රිකය විවරණය කරන්නා වූ මූලටීකාව අධ්‍යාත්මික රූපය විසින් ප්‍රත්‍ය වීමට නොකැමති වේ. ජනක ශක්තියෙන් හෝ වේවා උපස්ථම්භක ශක්තියෙන් හෝ වේවා බහිද්ධ වූ ඕජාව ම ප්‍රත්‍යය වේ යන අදහස ගනියි.)

**නාමාහාර ප්‍රත්‍යයේ ත්‍රිරාශිය**

එකුන් අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු නාමාහාර ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූපය, අසංඥසත්ත්ව කර්මජ රූපය ය, ප්‍රවෘත්ති කර්මජ රූපය යන මොවුහු නාමාහාර ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**නාමාහාර ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න -**

- ඵස්ස චෛතසිකය ප්‍රත්‍යය වන විට චේතනාව සහ විඤ්ඤාණය ප්‍රත්‍යයෝත්පන්න වේ. එමෙන් ම චේතනාව ප්‍රත්‍යය වන විට ඵස්සය සහ විඤ්ඤාණය ප්‍රත්‍යයෝත්පන්න වේ. විඤ්ඤාණය ප්‍රත්‍යය වන විට ඵස්සය සහ චේතනාව ප්‍රත්‍යයෝත්පන්න වේ. මේ නිසා ප්‍රත්‍යයෝත්පන්නයන්හි ඒ තුන ම අත්හරිනු නො ලබයි. සියලු චිත්ත චෛතසිකයෝ ප්‍රත්‍යයෝත්පන්න වෙත්.
- ලෝභ මූල ප්‍රථම සිත, චෛතසික, චිත්තජ රූප එකවර පහළ වන විට ඵස්සය ප්‍රත්‍යය වේ. ඵස්සය හැර සෙසු චෛතසික අටළොස සහ චිත්තජරූප ප්‍රත්‍යයෝත්පන්න වේ. එමෙන් ම චේතනාව -පෙ- ලෝභ මූල ප්‍රථම සිත -පෙ- විඤ්ඤාණය ප්‍රත්‍යය වේ. චෛතසික එකුන්විස්ස සහ චිත්තජ රූප ප්‍රථම සිත ප්‍රත්‍යයෝත්පන්න වේ.
- ප්‍රතිසන්ධි කෘත්‍යය සිදු කරන්නා වූ සිත්, චෛතසික, ප්‍රතිසන්ධි කර්මජ රූප පහළ වන විට ඵස්සය ප්‍රත්‍යය වේ. චිත්ත, චෛතසික, ප්‍රතිසන්ධි කර්මජ රූප ප්‍රත්‍යයෝත්පන්න වේ යන ආදි වශයෙන් දතයුතු වේ.